# උතුරුමැද පළාත

## කොන්ත්‍රාත් පදනම මත වාස්තු විද්‍යාඥ හා සැළසුම් ශිල්පී නිලධාරීන් බඳවා ගැනීම

**වැදගත්,**
**තමන් විසින් සකස් කරගත් ජීව දත්ත පත්‍රිකාවක් සමග 2016.08.27 දින පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා උතුරු මැද පළාත් සභා සංකීර්ණයේ 5 වන මහලේ පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය.**

01. උතුරු මැද පළාතේ ක්‍රියාත්මක කරනු ලබන අත්‍යවශ්‍ය හා කඩිනමින් නිම කළ යුතු ව්‍යාපෘතිවල සේවය කිරීම සඳහා වාස්තු විද්‍යාඥ හා සැළසුම් ශිල්පී තනතුර සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

**02. තනතුරු සංඛ්‍යාව**

I. වාස්තු විද්‍යාඥ තනතුරු 06

II. සැළසුම් ශිල්පී තනතුරු 12

**03. බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

I. අයදුම්කරු ශ්‍රී ලාංකිකයකු විය යුතුය.

II. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ අයෙකු නොවිය යුතුය.

III. සේවා පලපුරුද්ද ලබා තිබීම අමතර සුදුසුකමක් සේ සැලකේ

04. වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව නියමිත වැටුප හා අමතරව ක්ෂේත්‍ර රාජකාරී සඳහා ගමන් වියදම් දීමනා හිමි වේ.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

I. විධිමත් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුස්සන් තෝරා ගැනේ.

II. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණීමේ දී පහත සඳහන් සහතික වල මුල් පිටපත සමග අනු පිටපත් රැගෙන ආ යුතුය.

(අ) උප්පැන්න සහතිකය

(ආ) අධ්‍යාපන සහතික

(ඇ) පදිංචිය සනාථ කිරීම සඳහා වසමේ ග්‍රාම නිලධාරීගේ සහතිකය

(ඈ) සේවා සහතිකය

**ප්‍රධාන ලේකම්,**
**ප්‍රධාන ලේකම් කාර්යාලය,**
**උතුරු මැද පළාත.**